// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1818/33 – 2013 ජූලි 11 වැනි බ්‍රහස්පතින්දා – 2013.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/15/10/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. කේ. ඩී. බී. ජී. රණවීර මෙනෙවිය, අංක 49, මහවත්ත, කලුවැල්ගොඩ, මාකේවිට.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, අංක 758, දෙවන මහළ, බේස්ලයින් පාර, කොළඹ 09.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

වත්තල, හැඳල, නිමල මරියා මාවත, අංක 33/2 හි පාලිත වීරසේකර මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

1A – G 17952 – 335 (2013/07)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/15/10/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. කේ. ඩී. බී. ජී. රණවීර මෙනෙවිය, අංක 49, මහවත්ත, කලුවැල්ගොඩ, මාකේවිට.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, අංක 758, දෙවන මහළ, බේස්ලයින් පාර, කොළඹ 09.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියෙහි සේවයෙහි නියුතු ආර්. කේ. ඩී. බී. ජී. රණවීර මෙනෙවියට 2009 ජූලි මස සිට 2013 පෙබරවාරි මස දක්වා වාර්ෂික වැටුප් වර්ධක ලබා නොදීම සම්බන්ධයෙන් කිසියම් අසාධාරණයක් සිදුවී ඇත් ද? එසේ නම් හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 786

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.